# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන කෞතුකාගාරය සඳහා ස්මාර්ට් ජංගම දූරකථන යෙදුමක ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

**තෙන්නකෝන් ටී.එම්.එස්.එම්.**[1]

නූතන මානව සමාජය ඩිජිටල්කරණය වීමත් සමඟ ලෝකය සිසාරා සන්නිවේදනය කරමින් තොරතුරු බෙදාගැනීමට මානවයාට මං විවර වී ඇත. සන්නිවේදන කාර්යය හරහා මානවයා තුළ ආකල්ප හා හැසිරීම් රටා ඔස්සේ කැපී පෙනෙන වෙනසක් සිදු කිරීමෙහි ලා ස්මාර්ට් ජංගම දූරකථනය පාදක වී ඇති අතර එහි යෙදුම් භාවිතයෙන් දුරස්ථව සිටිමින් වුව ද විවිධ සම්පත් පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ හැකියාව පවතී. ලෝකයේ බොහෝ කෞතුකාගාර සඳහා ද ඩිජිටල් අවකාශය තුළ මෙවැනි ආකාරයේ යෙදුම් දැකගත හැකි වේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයන කෞතුකාගාරය සඳහා මෙවැනි ස්මාර්ට් ජංගම දූරකථන යෙදුමක් යෝජනා කිරීම හා එහි දළ සැලැස්මක් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූ අතර අධ්‍යයන කෞතුකාගාරයක ඩිජිටල් භාවිතාව පිළිබඳ අධ්‍යයනය කිරීම, අධ්‍යයන කෞතුකාගාර යෙදුමක් ඔස්සේ විශ්වවිද්‍යාලයට අමතර ආදායමක් උපයාගැනීම, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට හා වෙනත් ප්‍රජාවන්ට දුරස්ථව සිට වුව ද මේ ඔස්සේ දැනුම සපයාගැනීමට අවස්ථාව ලබාදීම හා සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියේ ම අධ්‍යයන කෞතුකාගාර සඳහා ස්මාර්ට් ජංගම දූරකථන යෙදුම් නිර්මාණය සඳහා කථිකාවතක් නිර්මාණය කිරීම යනාදිය මෙම පර්යේෂණයේ උප අරමුණු විය. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයන කෞතුකාගාරය අධ්‍යයනය කිරීම සඳහා ජංගම දූරකථන යෙදුමක් වැදගත් වන්නේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වූ අතර මේ ඔස්සේ යෝජනා කරනු ලබන අධ්‍යයන කෞතුකාගාර යෙදුම සඳහා අවශ්‍ය දළ සැලැස්මක් ඉදිරිපත්කොට ඇත. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර එහි දී පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික දැනුම ඇති විද්වතුන් හා පුරාවිද්‍යාව හදාරන විද්‍යාර්ථීන් වෙන වෙන ම සම්මුඛ සාකච්ඡාවට බඳුන්කර ඇත. ද්විතියික දත්ත ලෙස පර්යේෂණ වාර්තා, පුවත්පත් හා අන්තර්ජාල තොරතුරු යටතේ විවිධ අධ්‍යයන කෞතුකාගාර යෙදුම් හා ලිපි ද අධ්‍යයනය කරන ලදී. පර්යේෂණ යෝජනා වශයෙන් මෙම ව්‍යාපෘතිය උදෙසා තාක්ෂණික සහය හා අරමුදල් සපයාගත යුතු බව යෝජනා කෙරේ. සදාචාරාත්මක රාමු ලෙස පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගේ හා විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ අවසරයකින් යුතුව ඔවුන් සපයන තොරතුරු පටිගත කෙරිණි. සමස්තයක් වශයෙන් අධ්‍යයන කෞතුකාගාර යෙදුම් සංකල්පය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයන කෞතුකාගාරය සඳහා ඵලදායී ලෙස යොදාගත හැකි බව අනාවරණය කරගන්නා ලදී.

**මුඛ්‍ය පද :** අධ්‍යයන කෞතුකාගාර, යෙදුම්, ඩිජිටල්කරණය, ආදායම, පුරාවිද්‍යාව

[1]ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. shanika.thennakoon1994@gmail.com